# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,532—1946ක්වූ මාර්තු මස 22 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කේ ඉහිගල මුස්ලිම් පාඨශාලාව ඇදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,095. ගම—ඉහිගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | එගල්පහුර | වත්ත | ඉහිගල මුස්ලිම් පල්ලිය භාරකාරයෝ: කේ. හුසේන්, කේ. එම්. ඔමාර්ලිත්, ඊ. සින්න මරික්කාර්, ඒ. මාඩර් ලෙබ්බෙ සහ කේ. එස්. හමීඩ්, ඉහිගල | 0 0 37·6 |
| 2 | දල්කොටුව | එම | එම | 0 0 8·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පෙරවරු 10.30ට කචිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑමා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ මාර්තු මස 12වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඒ. ඇස්. කොහොඹන්-වික්‍රම,
ආණ්ඩුවේ උප ඒජන්ත වමන.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ජල-විදුලිඑලිය නිපදවීමේ ව්‍යාපාරය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. Extract 9 of V. P. 114. ගම—කිරිමන්එලිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 448 | හොරකන්දමූලහේන | වත්ත | තිත්තැවකොලුවේගෙදර ගමරාලලාගේ පුංචිමැනිකා, එම හිංගිරිහාමි සහ එම උක්කුමැනිකා, කිරිමන් එලිය, නෝර්ටන් බ්‍රිජ් | 0 1 11·7 |
| 449 | එම | එම | උඩබාගේගෙදර පුංචිමැනිකා, එම රන්මැනිකා, කලුවාහමූන කන්ද ගමරාලලාගේ පොලමොන් අප්පුහාමි, මුල්හිරරාලලාගේ හිංගිරිමැනිකා, කිරිමන් එලිය, නෝර්ටන් බ්‍රිජ් සහ කඳුදෙලකාකානමලාගේ පියරතනතෙර, පන්නන්ගම්මන විහාරය, රම්බොඩ | 0 1 0·7 |
| 450 | හොරකන්දෙමූලහේන, අඹගහමූලලන්ද | හේන | එම | 0 1 38·5 |
| 451 | එම | තේ ඉඩම | එම | 0 0 24·8 |
| 452 | අඹගහමූලලන්ද | පොල් අතු සෙවිලිකල ගෙයක් සහිත හේන | තිත්තැවකොලුවේගෙදර ගමරාලලාගේ පුංචිමැනිකා, එම හිංගිරිහාමි සහ එම උක්කුමැනිකා, කිරිමන්එලිය, නෝර්ටන් බ්‍රිජ් | 0 1 13·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1946ක්වූ අප්‍රේල් මස 17වෙනි දින පෙරවරු 10ට කචිසමට නෝර්ටන් බ්‍රිජ්හි සර්කිට් බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1946ක්වූ මාර්තු මස 13වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඊ. ව්. බසිනත්,
ආණ්ඩුවේ ඒජන්ත වමන.

---

ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—අත්තොක්කාවෙල පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "(Cap. 203) ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට පලාත් ආණ්ඩුකාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අවසාන ගම් සිතියමේ නො. 656, අතිරේක නො. 2. ගම—අත්තොක්කාවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 308 | පන්සලවත්ත | අවුරුදු 15 සිට 20 වන පොල් ඉඩම | කේ. ඇස්. ශ්‍රී සුමන්ගල නායක තේරෝ, වලහන්දුව | 0 0 11 |
| 309 | එම | එම | එම | 0 3 39·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වන් 1946ක්වූ අප්‍රේල් මස 15වෙනි දින පෙරවරු 10ට කතිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වන් 1946ක්වූ මාර්තු මස 4වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ජී. වී. පී. සමරසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වන් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කමිෂනර්තුමා; ඒනම්:— රත්නපුරේ සුසානභූමියේ මිණී පුළුස්සන ගොඩනැගිල්ලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වන් 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ හිසිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 478. ගම—රත්නපුරේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පැලපොල්වත්ත .. | පොල්වත්ත, 10–35 කොසෙල්පඳුරු 29 දිවුල්ගහයි, අඹගස් එකයි, කෝපිගස් 4යි, දෙල්ගස් 5යි, දොඹගස් 5යි, බම්බුපඳුරු 2යි, පුවක්ගස් 2යි, පොල් ගස් 56යි, වෙඩිබෙහෙත් කාමරයි සහ තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබේ | ඒ. තිලකරත්න, ජී. ඇන්. බොතලොත්තා, ආර්. ජේ. බී. බොතලොත්තා, ඒ. ඒ. කොර්නේලිස්, ඒ. එච්. ඇම්. අබ්දුල් අසීස්, බී. මල්හාමි, අබ්දුල් කාදිම්, බී. ජේ. බී. අන්ද්‍රදී, ජේ. බී. ජෝසප්, ඩබ්ලිව්. මිත්සන්ට් පෙරේරා, එල්. ඇෆ්. ජේ. සෙනෙවිරත්න, ඩබ්ලිව්. බී. ඒ. අමරසිංහ සහ ෆ්‍රැන්සිස් ද ජේ. සෙනෙවිරත්න, සියල්ලෝම රත්නපුරේ | 1 0 23·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අයව ලියමනක්ද් වන් 1946ක්වූ අප්‍රේල් මස 12වෙනි දින උදේ 11ට කතිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වන් 1946ක්වූ මාර්තු මස 18වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇම්. කේ. වී. සැන්ඩිස්,
සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## දැන්වීම.

අළුත්කුරු-හාපිටිගම් දෙකෝරළයේ කුඹුර හිමියන් සහ ගොවීන් වෙත දැන්වීමයි.

1943ගේ ආරක්ෂක (වී ගොවිතැන) අණපණත්,

1946 යල මෝසමේ වී ගොවිතැන ගැනයි.

වන් 1943ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින අංක 9,176 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ ආරක්ෂක (වී ගොවිතැන) විධානයන්හි 2 (1) ආඥාපණත යටතේ උතුරු අළුත්කුරුකෝරළේ "ඒ", උතුරු අළුත්කුරුළේ "බී", දකුණු අළුත්කුරුකෝරළේ සහ කොටස් තුනෙහිද, හාපිටිගම්කෝරළේද හදිසි කටයුතු පිළිබඳ උප දිසාපති සී. වී. පෙරේරා වන මම, මා පිට පැවරී තිබෙන බලතල අනුව එකී කෝරළයන්හි යල කන්නට කුඹුරු වැඩකිරීම පහත සඳහන් දිනවලට ප්‍රථමයෙන් ආරම්භකළයුතු බැව් මෙයින් නියම්කරමි.

නියමිත කාලසීමාව ඇතුළත වැඩනොකළ යම්කිසි කුඹුරු ඉහතකී කෝරළයන්හි ඇතිවූවහොත් එකී කුඹුරු වී ගොවිතැන පිළිබඳ ආරක්ෂක අණපණත්හි 3වෙනි පණත යටතේ මා භාරයට ගන්නා බැව්ද මෙයින් මැණිදුරවත් දැනුම්දෙනු ලැබේ.

| කෝරළයේ නම. | පහත සඳහන් දවස්වලට ප්‍රථමයෙන් කුඹුරුවැඩ ආරම්භකළයුතු වේ. |
|---|---|
| උතුරු අළුත්කුරුකෝරළය "ඒ" .. | 1946ක්වූ මාර්තු මස 15. |
| උතුරු අළුත්කුරුකෝරළය "බී" .. | 1946ක්වූ අප්‍රේල් මස 1. |
| දකුණු අළුත්කුරුකෝරළය .. | 1946ක්වූ අප්‍රේල් මස 30. |
| හාපිටිගම්කෝරළය .. | 1946ක්වූ අප්‍රේල් මස 30. |

සී. වී. පෙරේරා,
අළුත්කුරු හාපිටිගම් දෙකෝරළයේ
හදිසි කටයුතු පිළිබඳ උප දිසාපති.

වන් 1946ක්වූ මාර්තු මස 11වෙනි දින
අළුත්කුරුකෝරළේ ගම්පහ කච්චේරියේදීය.

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුව සහ කඩවත්සතර, ගංගබඩපත්තුව, කඳුබඩපත්තුව, වැලිගම්කෝරළය හා මොරවක්කෝරළයේ පිහිටි කුඹුරුවල 1946 යල් මෝසමේ වී ගොවිතැන් ආරම්භකිරීමට, 1943ක්වූ සැප්තැම්බර් මස 27 වැනි දින අංක 9,176 දරණ විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධකරනලද ආරක්ෂක (වී ගොවිතැන්) නියෝගයන්හි (2) වැනි නියෝගයෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර මෙහි පහත පෙනෙන දිනයන් නියමකරන්ට යෙදුනා ඇත :—

1. වැල්ලබඩපත්තුව හා කඩවත්සතර—1946 මාර්තු 15 වන දින
2. ගංගබඩපත්තුව—1946 මාර්තු 15 වන දින.
3. කඳුබඩපත්තුව—1946 මාර්තු 20 වන දින.
4. වැලිගම්කෝරළය—1946 මාර්තු 15 වන දින.
5. මොරවක්කෝරළය—1946 මාර්තු 26 වන දින.

2. තවද ඉහත සඳහන් දිනයන්හි හෝ ඊට ප්‍රථමයෙන් වැඩ ආරම්භනොකළ යම් යම් කුඹුරු ඇතිවුනි නම් ඒ කුඹුරු සියල්ලම ඉහත සඳහන්කළ නියෝගයන්හි (3) වැනි නියෝගයෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි මගේ පාලනයට ගන්නා බව සියළුදෙනා වෙත මැණිදුරවත් මෙයින් දන්වමි.

අත්සන්කළේ,

ඇම්. රාජේන්ද්‍ර,
මාතර උප දිසාපතිතැන.

වන් 1946ක්වූ මාර්තු මස 15 වන දින
මාතර කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.